/தொலைபேசி இல/Telephone Nos.

| | |
|---|---|
| inister | 2784832<br>2784807<br>2785617 |
| retary | 2784812 |
| ffice | 2785141-50<br>Fax: 2784846 |

-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

Your No. ………………………………

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/3/අකි.ලේ./සැලසුම්/159.....

දිනය / திகதி / Date 2014.07.28

චක්‍රලේඛ අංක : 26/2014

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

රජයේ පාසල්වල හා අනුමත පෞද්ගලික පාසල්වල ප්‍රධානීන් වෙත

## අ.පො.ස (සා.පෙළ) විභාගයේ ගණිතය විෂයය අසමත් වීම හේතුවෙන් දරුවන් පාසල් පද්ධතියෙන් ඉවත්වයාම වැළැක්වීම

අ.පො.ස (සා.පෙළ) විභාගයේ ගණිතය විෂයය අසමත් වීම හේතුවෙන් අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාවන් හැදෑරීමේ අවස්ථාව ලබා දීම සහතික නොවීම මත පාසල් යායුතු වයසේ දරුවන් පාසල් පද්ධතියෙන් ඉවත්වයාම අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවක් වී ඇති බව තහවුරු වී ඇත. මෙම තත්වය වළකාලීම හා කරන ගැනීම පිණිස ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් 2014.07.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය පරිදි පහත දැක්වෙන චක්‍රලේඛ විධිවිධාන පනවනු ලැබේ.

02. අ.පො.ස (උ.පෙළ) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව මීට පෙර නිකුත් කර ඇති 2008.04.30 දිනැති අංක 2008/17 දරණ චක්‍රලේඛයට හා 2008.12.31 දිනැති අංක 2008/17 (1) හා 2009.06.02 දිනැති අංක 2008/17(11) හා 2012.05.03 දිනැති අංක 2012/14 හා 2013.04.29 දිනැති අංක 2013/4 මගින් නිකුත් කරන ලද සංශෝධනයන්ට අමතර වශයෙන් පහත සඳහන් සංශෝධන ද ඇතුළත් කරමි.

03. ඒ අනුව එම චක්‍රලේඛයේ 2.2 වගන්තිය (ඇ) ලෙසට පහත දැක්වෙන පරිදි අ.පො.ස (උ.පෙළ) විෂය ධාරාවන් හැදෑරීම සඳහා ඇතුළත්වීමේ සුදුසුකම් සංශෝධනය කරනු ලැබේ.

2.2 (ඇ) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 6 ක් සම්මාන සාමාර්ථ 3 ක් සහිත සමත් වී එහෙත් ගණිතය විෂයය අසමත් වූ සිසුන් සඳහා එළඹෙන වර්ෂ 2ක් ඇතුළත අ.පො.ස (සා.පෙළ) විභාගයට ඉදිරිපත් වී ගණිතය සමත්වීමේ පදනම මත අ.පො.ස (උ.පෙළ) කලා විෂය ධාරාව හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ඇතුළත් තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීම පිණිස සුදුසුකම් ලබනු ඇත.

04. 2013 අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිට 2014 අ.පො.ස (උ.පෙළ) පංතිවලට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ කලා විෂය ධාරාව හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය ඇතුළත් තාක්ෂණවේදය විෂය ධාරාව හැදෑරීමට අපේක්ෂිත සිසුන් සඳහා ද මෙම සංශෝධනය බලපැවැත්වෙනු ඇත.

05. මේ ආකාරයට අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වී අ.පො.ස. (උ. පෙළ) හදාරණ සිසුන්ගේ ගණිතය සමත් කර වීමේ කාර්යය වෙනුවෙන් එම සිසුන් 20ට වැඩි සංඛ්‍යාවක් සිටින පාසල්වල සාමාන්‍ය විෂයය මාලාවේ කාර්යයට බාධාවක් නොවන පරිදි අතිරේක පංතියක් පවත්වා ඒ සඳහා දායකත්වයක් ලබා දීමට අදාළ පාසල් ප්‍රධානීන් විධිවිධාන යෙදිය යුතුය.

06. යම් පාසලක ඉහත 5 වගන්තිය දක්වා ඇති පරිදි එම ශිෂ්‍ය සංඛ්‍යාව 20ට අඩු අවස්ථාවල පාසල් ප්‍රධානීන් අදාළ කොට්ඨාස භාර අධ්‍යක්ෂවරයා මඟින් ඒ පිළිබඳ පහසුකම් සැපයීමට හැකි පාසලක් නම් කර එම සිසුන්ට ගණිතය සමත්වීම සඳහා අවශ්‍ය අතිරේක සහාය ලබා දීමට විධිවිධාන සැලසිය යුතුය.

07. ඉහත 06 වගන්තියේ සඳහන් කාර්යය ඉටුකරලීම පිණිස අදාළ කොට්ඨාස භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් තම කොට්ඨාසයේ පහසුකම් සහිත පාසල්වල ගණිතය විෂයය හැදෑරීමට අතිරේක අවස්ථාව සපයාදීමට එකී විදුහල්පතිවරුන් වෙත අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. මේ සඳහා දැනට මහින්දෝදය ද්විතියික පාසල්වල ස්ථාපිත කර ඇති ගණිතාගාරවල පහසුකම් ද යොදවා ගැනීමට සැලසුම් කර ගත යුතුය.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3. විභාග කොමසාරිස් ජනරාල්
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
5. විගණකාධිපති
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්